# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1988 අංක 44 දරන බටහිර සංගීතය සහ කථනය පිළිබඳ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1988 නොවැම්බර් මස 24 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1988 නොවැම්බර් මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිළ : ශත 60 යි          තැපැල් ගාස්තුව : ශත 75 යි.

## 1988 අංක 44 දරන බටහිර සංගීතය සහ කථනය පිළිබඳ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1988 නොවැම්බර් මස 24 වන දින]

එල්. ඩී.—ඕ. 35/87

**බටහිර සංගීතය සහ කථනය පිළිබඳ ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"ශ්‍රී ලංකාවේ බටහිර සංගීතය සහ කථනය පිළිබඳ ආචාර්යවර යන්ගේ සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක්, එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව ඒ සංගමයට සම්බන්ධ සියලු පරමාර්ථ හා කරුණු සඵලාකාරයෙන් ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා වර්ෂ එක් දහස් නවසිය හැටේ දී කොළඹ දී පිහිටුවා මෙතෙක් කල් පවත්වා ගෙන ගොස් ඇති හෙයින් ද : — පූර්විකාව.

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාර්ය සඳහාද ඒ පරමාර්ථ හා කාර්ය වඩා ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට සහ ඉටු කිරීමට එකී සංගමයට හැකි වීම පිණිස එකී සංගමය සංස්ථාගත කිරීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත සඳහා වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1988 අංක 44 දරන බටහිර සංගීතය සහ කථනය පිළිබඳ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. මින් මතු මේ පනතෙහි "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන බටහිර සංගීතය සහ කථනය පිළිබඳ ආචාර්යවරයන්ගේ සංගමයේ දැනට සාමාජිකයන්ව සිටින හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් සංඛ්‍යාව, මේ පනත ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මේ පනතෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "බටහිර සංගීතය සහ කථනය පිළිබඳ ආයතනය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් වන අතර, මෙයින් එය එසේ සංස්ථාපනය කරනු ලැබේ. තව ද එකී සංස්ථාගත නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ, පාවිච්චි කිරීමේ සහ ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. — බටහිර සංගීතය සහ කථනය පිළිබඳ ආයතනය සංස්ථාගත කිරීම.

3. සංස්ථාවේ පොදු පරමාර්ථ පහත සඳහන් ඒවා විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— — සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) බටහිර සංගීතයේ, කථනයේ සහ රංගනයේ විවිධ අංග පිළිබඳ අධ්‍යයනය වැඩිදියුණු කිරීම ;

(ආ) බටහිර සංගීතය, කථනය හා රංගනය අධ්‍යයනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ විද්‍යා පීඨයක් පිහිටුවීම හා එය පවත්වාගෙන යාම සහ ශිෂ්‍යත්ව සහ ත්‍යාග දක්ෂිණා ප්‍රදානය කිරීම සහ බටහිර සංගීතය, කථනය හා රංගනය අධ්‍යයනය කිරීම සඳහා දිරි ගැන්වීම;

(ඇ) බටහිර සංගීතය හා කථනය පිළිබඳ ආචාර්යවරයන් අතර මිත්‍රත්වය සහ අන්‍යෝන්‍ය අවබෝධය සම්බන්ධයෙන් බැඳීමක් ඇති කිරීම සහ ඒ සඳහා දිරි ගැන්වීම;

(ඈ) සංස්ථාවේ සාමාජිකයන්ගේ සම්බන්ධතා කෙරෙහි බලපාන කාරණා පිළිබඳව කටයුතු කිරීම;

(ඉ) බටහිර සංගීතය, කථනය හා රංගනය පිළිබඳ ප්‍රවීණතාව නිශ්චය කිරීම සඳහා විභාග පැවැත්වීම සහ ප්‍රවීණතා සහතික පත්‍ර ප්‍රදානය කිරීම;

(ඊ) සංස්ථාවේ සාමාජිකයන් අතර උසස් වෘත්තීය සම්මත පවත්වා ගෙන යාම සහතික කිරීම අරභයා සාමාජිකයන්ගේ වෘත්තීය කටයුතු විධිමත් කිරීම;

(උ) බටහිර සංගීතයට, කථනයට හා රංගනයට අදාළ කාරණා සම්බන්ධයෙන් සංස්ථාව සමග සාකච්ඡා කොට එහි අදහස් නිශ්චය කොට දැන ගැනීමේ අවස්ථාව ආණ්ඩුවට, වෘත්තීය මණ්ඩලවලට සහ වෙනත් තැනැත්තන්ට හෝ මණ්ඩලවලට සැලසීම;

(ඌ) සංස්ථාවේ පරමාර්ථ වැඩිදියුණු කර ගැනීමෙහිලා ශ්‍රී ලංකාවේ සහ වෙනත් රටවල ඇති ඒ හා සමාන ආයතන සමග සම්බන්ධීකරණය ඇති කිරීම.

සංස්ථාවේ බලතල

4. ආයතනයේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වා ගෙන යාමේ සහ වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීමේ ද ආයතනයේ අරමුදල් ආයෝජනය කිරීමේ ද නිලධරයන් සහ සේවකයන් නියුක්ත කර ගැනීමේ, සේවයෙහි යෙදවීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව, ආයතනයේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර හෝ ආකාරයක සියලු ක්‍රියා කරුණු හෝ දේවල් ඉටු කිරීමේ, සිදු කිරීමේ සහ ක්‍රියාවේ යෙදවීමේ බලය, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවට ඇත්තේ ය.

5. (1) සංස්ථාවේ කටයුතු, සංස්ථාවේ තත්කාලයේ බල පවත්නා රීති වලට යටත්ව, ඒ රීතිවලින් විධිවිධාන සලසා ඇති පරිදි සහ ඒ අනුව තෝරා පත් කර ගනු ලැබූ තැනැත්තන්ගෙන් සමන්විත පාලක සභාවක් විසින් පරිපාලනය කළ යුතු ය. ආයතනයේ කටයුතු කළමනාකරණය කරම.

(2) මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී ධුර දරූ ආයතනයේ පාලක සභාව සංස්ථාවේ ප්‍රථම පාලක සභාව වන්නේය.

6. (1) ආයතනයේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ එහි පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා, කලින් කල යම් මහා සභා රැස්වීමක දී හෝ විශේෂ මහා සභා රැස්වීමක දී, ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක ඡන්දයෙන් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සංස්ථාව විසින් සෑදීම නීත්‍යානුකූල වන්නේය. එසේ සාදනු ලැබූ රීති ඒ හා සමාන රැස්වීමකදී ඒ හා සමාන ආකාරයකින් වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළ හැකි ය. සංස්ථාවේ රීති.

(2) මේ පනත ආරම්භ වන දිනයෙහි බලාත්මකව පවත්නා සංගමයේ රීති මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන වලට අනනුකූල නොවනතාක් දුරට සංස්ථාවේ රීති වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

7. (1) මිලට ගැනීමෙන්, ත්‍යාග කිරීමෙන්, උරුමවීමෙන්, තෙස්තමේන්තු නියාදනයකින්, හුවමාරු කිරීමෙන් හෝ අන්‍යාකාර යකින් චංචල හෝ නිශ්චල දේපළ කිසිවක් අත්කර ගැනීමට සහ දැරීමට ද එසේ අත්කර ගන්නා ලද හෝ දරනු ලබන යම් දේපළක් නියාදනය කිරීමට ද නීතිය අනුව ආයතනයට හැකියාව සහ බලය ඇත්තේ ය. දේපළ දැරීමේ සහ මුදල් ලබාගැනීමේ බලය.

(2) ආයතනයේ පරමාර්ථ නංවාලීම සඳහා අවශ්‍ය මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ඒ මුදල් සුරකුම් කිරීමේ කාර්යය සඳහා උකස්, බැඳුම්කර හෝ බැඳීම් කිසිවක් ඇති කිරීමේ, ලියා අත්සන් කිරීමේ, ප්‍රදානය කිරීමේ හෝ නිකුත් කිරීමේ සහ පරමාර්ථ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය වන යම් ආකාරයකින් ස්වකීය අරමුදල් ආයෝජනය කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

(3) සංස්ථාව විසින් අත් කර ගනු ලබන හෝ දරනු ලබන සියලු චංචල හෝ නිශ්චල දේපළ සහ මේ පනත යටතේ හෝ බලාත්මකව පවත්නා රීති යටතේ සංස්ථාවට ගෙවනු ලබන හෝ සංස්ථාව විසින් භාරගනු ලබන සියලු මුදල් ඒ රීති වලට අනුව සංස්ථාව විසින් දැරීම, ප්‍රයෝජනයට ගැනීම සහ අදාළ කිරීම කරනු ලැබිය යුතු ය.

ගාස්තු සහ දායක මුදල් අයකිරීමට ඇති බලය.

8. (අ) සංස්ථාව විසින් පවත්වනු ලබන යම් විභාගයකට ඇතුළත් කර ගැනීම සඳහා යුක්තිසහගත යයි සංස්ථාව විසින් සලකනු ලබන යම් ගාස්තු ;

(ආ) සංස්ථාවේ සාමාජිකත්වය සම්බන්ධයෙන් යම් සාමාජික පන්තියකට තැනැත්තන් තෝරා පත්කර ගැනීම සඳහා ගාස්තු ; සහ

(ඇ) සංස්ථාව විසින් සලස්වනු ලබන සේවාවන් සම්බන්ධයෙන් යුක්තිසහගත යයි සංස්ථාව විසින් සලකනු ලබන යම් දායක මුදල් සහ ගාස්තු

අය කිරීමට නීතිය අනුව සංස්ථාවට හැකියාව සහ බලය ඇත්තේ ය.

සංස්ථාව විසින් ගෙවිය යුතු සහ සංස්ථාවට අයවිය යුතු ණය.

9. මේ පනත ආරම්භ වන දිනයෙහි දී පවත්නා වූ සංගමයේ සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, සංගමයට ලැබිය යුතු සියලු ණය සහ ගෙවිය යුතු දායක මුදල් සහ ගාස්තු සංස්ථාවට ගෙවිය යුතු ය.

සංස්ථාවේ ගිණුම්.

10. (1) සංස්ථාවේ ආදායම සහ වියදම, ණය, බැරකම් සහ වෙනත් සියලු මූල්‍ය ගණුදෙනු කටයුතු සම්බන්ධයෙන් නියි ගිණුම් පොත් තැබීමට සංස්ථාව විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම්, වාර්ෂික මහා සභා රැස්වීමේ දී පත් කරනු ලැබූ සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයකු" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවනු ලැබූ වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වන්නා වූ ද ගණකාධිකාරීවරයකු ලෙස වෘත්තියේ යෙදීමට ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද පුද්ගලයෙක් ; හෝ

(ආ) ගණකාධිකාරී සමාගමක් නම් ඒ සමාගමේ එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවනු ලැබූ වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වන්නා වූ ද ගණකාධිකාරීවරයකු ලෙස වෘත්තියේ යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද ගණකාධිකාරී සමාගමක් අදහස් වේ.

**11.** සභාපති, නියෝජ්‍ය සභාපතිවරයකු සහ වෙනත් එක් නිලධරයකු ඉදිරිපිට දී හැර කවර හෝ සාධන පත්‍රයකට සංස්ථාවේ මුද්‍රාව නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. තවද, එසේ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සනකට පරිබාහිර විය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුත්තේ කෙසේ ද යන වග.

**12.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මඟින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 177 කි. (විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම **දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.**